මගේ අංකය / எனது இல. / My No. } PN/Media/PR

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................

දිනය / திகதி / Date } 2015.06.15

**මාධ්‍ය නිවේදනයයි**

**DOP – Business Partners Network Session – 2015**

විශ්‍රාමික ප්‍රජාව වෙත විශ්‍රාම වැටුපෙන් ඔබ්බට ගිය වෙනත් ඵලදායි සේවාවන් සැපයීමේ දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමඟ අත්වැල් බැඳගත් අනෙකුත් රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන ඇගයීමේ හා අත්දැකීම් හුවමාරු කරගැනීමේ හමුවක් 2015.06.12 වන දින කැලණිය වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතනයේ දී පැවැත්විය.

මෙහි දී විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් සුවිශේෂී සේවා හඳුන්වා දුන් රාජ්‍ය හා පෞද්ගලික ආයතන රැසක් ඇගයීමට ලක්විය. ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය, පොලීසිය ඇතුලු රාජ්‍ය අංශ ද , පෞද්ගලික බැංකු, මූල්‍ය ආයතන, රක්ෂණ සමාගම් සහ විවිධ පෞද්ගලික ව්‍යාපාරික ආයතන ද නියෝජනය කරමින් 100 කට අධික සම්භාවනිය අමුත්තන් රැසක් සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙනුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ඇතුලු නිළධාරී පිරිසක් සහභාගි විය.

මේ හමුවේ දී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් දියත් කරන ලද ව්‍යාපෘති 24 ක් ඇගයීමට ලක්විය. විශේෂයෙන් අනාගතයේ දී සියලු ආයතන ඒකාබද්ධ කරගත් ව්‍යාපෘති රැසක් පිළිබඳ අවධානය යොමු වූ අතර එහි පළමු පියවරක් ලෙස විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් විශේෂ කෙටි පණිවිඩ පුවත් සේවාවක් දියත් කිරීම Mobitel ආයතනය හා National News Network ආයතනය හා එක්ව සිදු කෙරිණ.

රාජ්‍ය යාන්ත්‍රනය හා එක්ව ඉතා උනන්දුවෙන් විශ්‍රාමික ප්‍රජාව වෙත ප්‍රතිලාභ ලබා දීමට සහය පළ කිරීම පිළිබඳ සමස්ත රාජ්‍ය සේවය වෙනුවෙන් සහ පන්ලක්ෂ පනස් දහසක් පමණ වන විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් සුනිල් හෙට්ටිආරච්චි මහතා සිය කෘතවේදීත්වය පළ කළේය.

නාවික හමුදා පෙරදිග සංගීත කණ්ඩායමේ ගායන හා වාදන අංගයන් සහ නාවික හමුදා සංස්කෘතික අංශයේ නර්තන අංගයන් මෙම අවස්ථාව වර්ණවත් කළේය.

**මාධ්‍ය ඒකකය**
**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**